# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2297/63 – 2022 සැප්තැම්බර් 16 වැනි සිකුරාදා – 2022.09.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/Z/2016/15.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2277/38 දරන හා 2022.04.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් 1. රත්නපුර, කුරුවිට, කාහේන්ගම, අංක 198/15 හි පදිංචි ඩබ්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා, 2. කටුගස්තොට, කොන්ඩදෙනිය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ස්ථානභාර නිලධාරී නිලනිවාස, අංක 01 හි පදිංචි යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මහතා, 3. රත්නපුර, නව නගරය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (සබරගමුව), ජේ. ඒ. එන්. බී. ජයසූරිය මහතා, 4. මාතලේ, ඔය පහල, ජලපවිත්‍රාගාරය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වැඩභාර නිලධාරී, ජේ. එම්. ටී. එන්. බී. ජයසිංහ මහතා 5. මාතලේ, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය, ඉංජිනේරු සහකාර (සිවිල්), කේ. එම්. ටී. තරංගනී මහත්මිය සහ රත්මලාන, ගාලු පාර හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 20/2017 දරන හා 2022.02.20 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 20/2017 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2023.04.27 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 37493 – 11 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 51 දරන කාර්මික ආරවුල් පනත**
**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ගාලු පාර,
රත්මලාන,
දිනය : 2022.08.22.

කම්කරු කොමසාරිස් ජෙනරාල්තුමා,

2022.04.27 දිනැති අංක 2277/38 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද අංක A/20/2017 දරන ඩබ්. වී. ඩී. එම්. පී. වැල්අරඹ සහ තවත් සේවකයින් 4 දෙනෙකු සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය බැඳී සිටින්නා වූ ද 2022.02.20 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

සාමාන්‍යාධිකාරී,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන
මණ්ඩලය.

පිටපත් (අනෙක් පාර්ශවය)

| | | |
|---|---|---|
| 1. | ඩබ්. වී. ඩී. එම්. පී. වැල්අරඹ | අනෙක් පාර්ශවය |
| 2. | යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න | |
| 3. | ජේ. ඒ. එන්. බී. ජයසූරිය | |
| 4. | ජේ. එම්. ටී. එන්. බී. ජයසිංහ | |
| 5. | කේ. එම්. පී. තරංගනී | |

1) ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳීසිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට වෙන වෙනම දන්වීම යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වගන්තිය බලන්න)

2) දන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතු ය.

EOG 09 - 0161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.